රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 303

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 අගෝස්තු මස 16 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රජයේ නිලධරයන්ට අධ්‍යයන කටයුතු/පුහුණු කටයුතු සම්බන්ධයෙන් වන සම්පූර්ණ වැටුප් සහිත මෙරට අධ්‍යයන නිවාඩු සඳහා වූ අනිවාර්ය සේවා කාලය සංශෝධනය කිරීම.**

අංක.178 සහ 1975.02.28 දින දරණ ආයතන චක්‍රලේඛය යටතේ සම්පූර්ණ වැටුප් සහිත මෙරට අධ්‍යයන නිවාඩු සඳහා වන අනිවාර්ය සේවා කාලය මෙයින් සංශෝධනය කෙරේ. රජයේ නිලධරයකු අධ්‍යයන කටයුතු හෝ පුහුණු කටයුතු සඳහා ලබාගන්නා සම්පූර්ණ වැටුප් සහිත මෙරට අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් අනිවාර්ය සේවයක යෙදෙන බවට පහත සඳහන් පරිදි ගිවිසුමකට එළඹිය යුතුය.

(1) දැනට බලපවත්වන පරිදි මසක් හෝ ඊට අඩු කාලයක් සඳහා අනිවාර්ය සේවා කාලයක් නොමැත.

(11) මසකට වැඩි කාලයක් සම්බන්ධයෙන් අනිවාර්ය සේවා කාලය, හය මසක අවමයකට හා වර්ෂ පහක උපරිමයකට යටත්ව, නිවාඩු කාලය මෙන් දෙගුණයක් විය යුතුය.

(111) අනිවාර්ය සේවා කාලය ගණන් බැලිය යුත්තේ ආසන්නම සම්පූර්ණ මාසයටය

02. ඉහත දක්වා ඇති අනිවාර්ය සේවා කාලයන්, නිලධාරීන් දැනටමත් එළඹ ඇති බැඳුම්කර/ගිවිසුම් වලට ද අදාළ වනු ඇත.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.